ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන-හයවන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2019

තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු - ESU4216/STU6516

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2019.02.20 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "තුලනාත්මක අධ්‍යාපනය" සඳහා ඔබේම සුදුසු නිර්වචනයක් ඉදිරිපත් කරන්න.

02. තුලනාත්මක අධ්‍යාපනය හැදෑරීමේ වැදගත්කමට අදාළ කරුණු පහක් (05) දක්වන්න.

03. බහු වාර්ගික රටක් වන ඕස්ට්‍රේලියාව භාෂා ගැටලු විසඳීම සඳහා ගනු ලැබූ වැදගත් තීරණ හතරක් (04) සඳහන් කරන්න.

04. ජපානයේ දක්නට ලැබෙන පාසල් වර්ග පහක් (05) දක්වන්න.

05. පැරණි ස්වදේශීය අධ්‍යාපනයේ විශේෂ ලක්ෂණ පහක් (05) නම් කරන්න.

06. 1981 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල සඳහන් පොකුරු පාසල් සංකල්පය පැහැදිලි කරන්න.

07. 2003 දී ජාතික අධ්‍යාපන කොමිසම විසින් හඳුන්වා දුන් නිපුණතා දෙකක් (02) සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. හන්දෙස්ස ක්‍රමය නොහොත් ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමයේ (1932) ධනාත්මක ලක්ෂණ පහක් (05) දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) බහු වාර්ගික බව යනු කුමක්දැයි සුදුසු උදාහරණයක් ඇසුරින් පහදන්න. (ලකුණු 05)

(ii) බහු වාර්ගික සමාජයක පැන නැගිය හැකි අධ්‍යාපන ගැටලු තුනක් **(03)** විග්‍රහ කරන්න. (ලකුණු 06)

(iii) බහුවාර්ගික සමාජයක් ලෙස ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ඉහත අධ්‍යාපන ගැටලු අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 09)

10. (i) මෙයිජි පාලන සමයේ ජපානයේ සිදු කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පහක් **(05)** ක් නම් කරන්න. (ලකුණු 05)

(ii) ජපානය අධ්‍යාපනය තාක්ෂණික අතින් ඉතා ඉහළ මට්ටමක පසුවේ. ජපානයේ පරිගණක තාක්ෂණය අධ්‍යාපනය සඳහා යොදා ගැනීමේ ක්‍රමික විකාශය හා වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාව තුළ පරිගණක තාක්ෂණය ආශ්‍රිතව ඉගැන්වීම සිදු වෙමින් පවතී. එය ජපානයේ මෙන් උසස් මට්ටමකට ගෙන ඒමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග හා ඒවා අවම කිරීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 09)

11. (i) 'මානව සංවර්ධනය' යනු කුමක් ද? (ලකුණු 04)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපන ගැටලු පහක් **(05)** නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහතින් විස්තර කළ ගැටලු දෙකක් **(02)** තෝරා ගෙන එම ගැටලු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 08)

12. (i) 1931 දී අධ්‍යාපන ආඥාපනත ගෙන ඒමට මූලික වූ හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුව විසින් පැවති අධ්‍යාපන ක්‍රමයේ හඳුනාගත් දුර්වලතා මොනවා ද? (ලකුණු 05)

(iii) 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුවේ නිර්දේශ හතරක් **(04)** සඳහන් කර ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතියට ඒ මගින් සිදු වූ ධනාත්මක බලපෑම අගයන්න. (ලකුණු 10)

13. (i) 1971 ජයරත්න කමිටුව නොහොත් උසස් අධ්‍යාපනය ප්‍රතිසංවිධානය කිරීම සඳහා වන කමිටුවේ ප්‍රධාන නිර්දේශ දෙකක් **(02)** දක්වන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපනයේ සංවර්ධනය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනයේ විකාශනය පිළිබඳ ඇගයීමක් සිදු කරන්න. (ලකුණු 10)

14. (i) 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණවල දී විෂයමාලාවේ සිදු කරන ලද වෙනස්කම් හතරක් **(04)** යෝජනා කරන්න. (ලකුණු 04)

(ii) 1944 බට්ලර් පනත මගින් කරන ලද ත්‍රිභේදිත පාසල් ක්‍රමයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපනයේ බාහිර කාර්යක්ෂමතාව යන්න හඳුන්වා, එය වර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.